වෙරිටේ විදසුන්

2018 ජූලි

05 වැනි වෙළුම, 02 කාණ්ඩය

VERITÉ RESEARCH
Strategic Analysis for Asia

වෙරිටේ රිසර්ච් යනු, ආර්ථික විද්‍යාව, නීතිය, දේශපාලනය සහ ජනමාධ්‍යය විෂයෙහි ඉහළ මට්ටමේ තීරකවරුන් සඳහා උපායමාර්ගික විශ්ලේෂණ සපයා දෙන, කොළඹ පිහිටි, ස්වාධීන බුද්ධි පර්ෂදයකි.

**හස්නා මුනාස්**
**නිලංගිකා ප්‍රනාන්දු**
*පර්යේෂණය*

**නිශාන් ද මෙල්**
*විදසුන් මාලා සංස්කාරක*

**වසර 15ක්**
WHO FCTC අපරානුමත කර ගෙවී තිබෙන කාලය

**10% ක**
බදුවලට සාපේක්ෂ මිල අනුපාතයේ පහත වැටීමක්
(2006 වසර සිට වඩාත්ම ජනප්‍රිය සන්නාමය ගත්විට)

**මාස 20+**
අවසානයට බදු වැඩි කර ගෙවී තිබෙන පසුබිමක්



Image courtesy of Pexels

# දුම්කොළ ප්‍රතිපත්තිය: ඇල්මැති පාර්ශවයන්ගේ බලපෑම අවම කිරීම

ශ්‍රී ලංකාව 2003 වසරේ සිට ලෝක සෞඛ්‍ය සංවිධානයේ (WHO) දුම්කොළ පාලනය පිළිබඳ රාමු සම්මුතිය (FCTC) අපරානුමත කර ඇත. නමුදු තවමත්, ඇල්මැති පාර්ශ්වයන්ගේ බලපෑම්වලින්, දුම්කොළ ප්‍රතිපත්තිය ආරක්ෂා කිරීමට අදාළ විධිවිධාන ක්‍රියාත්මක කර නොමැත. මෙම විදසුන තුළින්, එසේ නොකිරීමේ ප්‍රතිවිපාක සහ, ඇල්මැති පාර්ශ්වයන් ඇතිකරන්නාවූ බලපෑම අවම කිරීම සඳහා ගත හැකි අර්ථවත් පියවර ගවේෂණය කරයි.

ලංකාව 2003 නොවැම්බරයේදී ලෝක සෞඛ්‍ය සංවිධානයේ (WHO) දුම්කොළ පාලනය පිළිබඳ රාමු සම්මුතිය (FCTC) අපරානුමත කළේය. එෆ්.සී.ටී.සී. (FCTC) යනු දුම්කොළ පරිභෝජනයෙන් ඇති වන සෞඛ්‍ය ප්‍රතිවිපාක සහ දුම්කොළ කර්මාන්තයට ඇල්මැති පාර්ශ්වයන් විසින් කරනු ලබන දැවැන්ත බලපෑමට ප්‍රතිචාරයක් ලෙස සකස් කරන ලද ගෝලීය ගිවිසුමකි. ප්‍රතිපත්ති සම්පාදකයින් කෙරෙහි දුම්කොළ කර්මාන්තය විසින් කරනු ලබන අනවශ්‍ය බලපෑම හඳුනාගෙන, ඒ සඳහා පැහැදිලි ආරක්ෂාවක් එෆ්.සී.ටී.සී. (FCTC) විසින් 5.3 වන වගන්තිය ස්වරූපයෙන් ඉදිරිපත් කර ඇත. "දුම්කොළ පාලනය සම්බන්ධයෙන් ඔවුන්ගේ මහජන සෞඛ්‍ය ප්‍රතිපත්ති සැකසීමේදී හා ක්‍රියාත්මක කිරීමේදී, වාණිජ හා දුම්කොළ කර්මාන්තයට සම්බන්ධ වෙනත් ඇල්මැති පාර්ශවයන්ගේ බලපෑමෙන් මෙම ප්‍රතිපත්ති ආරක්ෂා කිරීමට රාජ්‍ය නීතීන්ට අනුකූලව පාර්ශවයන් විසින් කටයුතු කළ යුතු ය", යනුවෙන් එහි සඳහන් වේ.

ශ්‍රී ලංකාව එෆ්.සී.ටී.සී. (FCTC) අපරානුමත කර ඇතත්, 5.3 වගන්තිය තවමත් බලාත්මක කර නොමැත. එබැවින්, දුම්කොළ ප්‍රතිපත්ති, වාණිජ හා ඇල්මැති පාර්ශවයන්ගේ බලපෑම් වලට යටත් වීමේ අනතුර තවමත් එලෙසම පවතී. වෙරිටේ රිසර්ච් විසින් මීට පෙර පළ කරන ලද - "සිගරට් බද්ද පිළිබඳ නොමඟ යවන සුළු, සාවද්‍ය තොරතුරුවලට වගකිවයුත්තේ කවුරුන්ද?" යන විදසුන තුළින්, දුම්කොළ කර්මාන්තය මාධ්‍ය කෙරෙහි අනවශ්‍ය බලපෑමක් සිදු කරන බව අනාවරණය කළේය. දුම්කොළ කර්මාන්තය, ශ්‍රී ලංකාවේ නිළධාරීන්ට හා ප්‍රතිපත්ති සම්පාදකයින්ට, අනිසි ලෙස බලපෑම් කරන බව පෙන්නුම් කරන සලකුණු පිළිබඳව මෙම විදසුන තුළින් සාකච්ඡා කෙරේ. මෙම ප්‍රතිපත්ති,

එවැනි බලපෑම් වලින් ආරක්ෂා කිරීම සඳහා යොදා ගත හැකි උපාය මාර්ග ද මෙම විදසුන තුළින් නිර්දේශ කරයි. දුම්කොළ ප්‍රතිපත්තියට හානියක් වීම වළකා ගැනීම සඳහා එෆ්.සී.ටී.සී. (FCTC) පූර්ණව බලාත්මක කිරීමේ ඇති වැදගත්කම මෙහි ඇතුළත් නිර්දේශ මගින් අවධාරණය කරයි.

## ශ්‍රී ලංකා සන්දර්භය

ශ්‍රී ලංකාවේ දුම්වැටි කර්මාන්තය ඒකාධිකාරී නිෂ්පාදකයෙකුගෙන් සමන්විත වේ. එම නිෂ්පාදකයා වන්නේ ශ්‍රී ලංකා දුම්කොළ සමාගම (CTC) වේ. ඒකාධිකාරී නිෂ්පාදකයෙකු ලෙස, බදුකරණය සහ නියාමනය පිළිබඳ තීරණ ගන්නන් කෙරෙහි දැඩි බලපෑමක් එල්ල කිරීමේ බලයක් CTCයට ඇත.

CTCට ලාභ ගෙන දෙන හේතු කාරණා බොහෝ දුරට ශ්‍රී ලංකාවේ ජාතික අවශ්‍යතා වන මහජන සෞඛ්‍යය හා රාජ්‍ය ආදායම යන අංශ දෙක හා සෘජුව ගැටෙයි. මිනිසුන් වැඩිපුර දුම්පානය කරන විට, තරුණ වයසේදී දුම්පානය ආරම්භ කරන විට සහ දුම්පානයට ඇබ්බැහිවූ විට CTCය ප්‍රතිලාභ ලබයි. මෙම කරුණු තුනම හේතුවෙන් මහජන සෞඛ්‍යය පිළිබඳ වූ ජාතික අවශ්‍යතාව පීඩා විඳී. ඕනෑම දුම්වැටි මිලක් සඳහා , බදු ප්‍රතිශතය අඩු වූ විට CTCය ප්‍රතිලාභ ලබන අතර, බදු ප්‍රතිශතය වැඩි වන විට රාජ්‍ය භාණ්ඩාගාරය ප්‍රතිලාභ ලබයි.

මහජන සුවසෙත සහ සමාගමට ලාභ ගෙන දෙන හේතු අතර ඉතා විශාල අසමතුලිතතාවක් පවතින තත්වයක් තුළ, තීරණ ගැනීමට බලය සහිත පාර්ශවය සමාගමේ අනවශ්‍ය බලපෑම්වලට යටත් නොවීම වැදගත්ය. FCTC හි 5.3 වන වගන්තිය හරහා උත්සහ කරන්නේ මෙවැනි බලපෑම්වලින් තීරණගන්නන් ආරක්ෂා කිරීමටයි. කෙසේ වෙතත්, 5.3 වන වගන්තිය බලාත්මක කිරීමට අපොහොසත් වීම තුළින්, ශ්‍රී ලංකාවේ නිළධාරීන් මෙම ඇල්මැති පාර්ශවයන්ගේ අනවශ්‍ය බලපෑමට යටත් වන පරිසරයක් නිර්මාණය වී ඇති බවට ප්‍රබල සලකුණු තිබේ.

**CTC ට ලාභ ගෙන දෙන හේතු කාරණා බොහෝ දුරට ශ්‍රී ලංකාවේ ජාතික අවශ්‍යතා වන මහජන සෞඛ්‍යය හා රාජ්‍ය ආදායම යන අංශ දෙක හා සෘජුව ගැටෙයි. මිනිසුන් වැඩිපුර දුම්පානය කරන විට, තරුණ වයසේදී දුම්පානය ආරම්භ කරන විට සහ දුම්පානයට ඇබ්බැහිවූ විට CTCය ප්‍රතිලාභ ලබයි.**

## නිළධාරීන්ට බලපෑම් කරන බවට වන සලකුණු

ශ්‍රී ලංකාවේ මුදල් අමාත්‍යාංශයේ සිට භාණ්ඩාගාරය සහ මහ බැංකුව දක්වා කිසිදු මූල්‍ය ආයතනයක්, දුම්වැටි සඳහා බදු අය කිරීම හෝ මිල නියම කිරීම සඳහා තාර්කික සහ ස්ථිර ක්‍රමවේදයක් හෝ සූත්‍රයක් අනුගමනය නොකරන බව, මීට පෙර විදසුනක් තුලින්ද වෙරිටේ රිසර්ච් ආයතනය පෙන්වා දී ඇත. ඉහත සඳහන් කළ පළමු විදසුනේ දක්වා තිබූ ආකාරයට දුම්වැටි බදුකරණය හා මිල නියම කිරීම පිළිබඳ මාධ්‍ය තුළින් මතු වී ආ ස්ථාවරයන් වැරදි බව දත්ත හා විශ්ලේෂණ මගින් ඔප්පු කර තිබියදීද මුදල් අමාත්‍යාංශයේ නිළධාරීන් නැවත නැවතත් එම වැරදි ස්ථාවරයන් මතම පිහිටා කටයුතු කිරීම, දුම්වැටි බදු සංශෝධන දුර්වල ලෙස කළමනාකරණයට හේතුවක් වේ. නිළධාරීන්ගේ උපදෙස් හා ක්‍රියාමාර්ග ගැන සැකසංකා ඇති කිරීමට තුඩු දෙන කරුණු තුනක් තිබේ.

### පළමු කරුණ: දුම්වැටි බද්ද හා මිල අතර අනුපාතයට පහත වැටීමට ඉඩ දීම

2005 න් පසු දුම්වැටි සඳහා වන බදු අනුපාතය උච්චාවචනය වී ඇති බව සහ සැලකිය යුතු ලෙස පහත වැටී ඇති බව පළවෙනි රූප සටහනෙන් දැක්වේ. 2015 වසරට පසුව මෙය තවදුරටත් පහත වැටුණු අතර, මෙම පහත වැටීම 2016

ඔක්තෝම්බර් මස නිෂ්පාදන බද්ද වැඩි කිරීම සහ වැට් බද්ද නැවත හඳුන්වාදීම හරහා වැරදි නිවැරදි කරන්නට ගත් ක්‍රියා මාර්ග වලට පෙර සිදු විය. මෙම ක්‍රියා මාර්ග ගනු ලැබුවේ 2016 වසරේ පළමු කාර්තුව සිට තෙවන කාර්තුව (Q1-Q3) දක්වා දුම්වැටි මිල සහ බදු අතර අනුපාතය 4% කින් පහත වැටීමෙන් පසුවය (පළවෙනි රූප සටහන බලන්න). මේ අවස්ථාව වනවිටත් රජය අනෙක් සියලුම භාණ්ඩ සඳහා වැට් බද්ද 4% කින් වැඩි කර තිබිණි (දුම්වැටි වැට් බද්දෙන් නිදහස්ව තිබිණි).


### දෙවන කරුණ: බදුවල වැරදි නිවැරදි කර ඉහළ ප්‍රතිලාභ ලබාගන්නට හැකි ක්‍රියාමාර්ගයන්ට එරෙහි වීම

2016 ඔක්තෝම්බර් මාසයේදී ගනු ලැබූ වැරදි නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගය, රාජ්‍ය ආදායම ඉහළ නැංවීමට මෙන්ම මහජන සෞඛ්‍යයට ඇතිවිය හැකි අයහපත් ප්‍රතිවිපාක අවම කිරීමෙහිලා රජය ගත් සාර්ථක පියවරක් විය (ඊට ප්‍රතිවිරුද්ධ මත සහිත මාධ්‍ය වාර්තා තිකුත් වුවද). දුම්වැටි පරිභෝජනය 18.4% කින් අඩුවූ බවත් නිෂ්පාදන බද්දෙන් සහ එකතු කළ අගය මත (වැට්) බද්දෙන් 2016 සිට 2017 දක්වා රජයට හිමිවන ආදායම රු. බිලියන 17.6 කින් ඉහළ ගිය බවත් දුම්කොළ සමාගමේ වාර්ෂික වාර්තාවේ ද සඳහන් විය. මෙම සාධනීය ක්‍රියාමාර්ගය ගැනීමට මුල් වූයේ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියේ ද සහාය ඇතිව ඉදිරිපත් කරන ලද කැබිනට් පත්‍රිකාවකි. මුදල් අමාත්‍යාංශය විසින් ඊට ප්‍රතිවිරුද්ධව ලබා දුන් ලිඛිත උපදෙස් නිසා මෙම තීරණය ක්‍රියාවට නැංවීම මාස කිහිපයකින් ප්‍රමාද විය.

### තෙවන කරුණ: ආදායම ඉහල දමා ගැනීමේ අවස්ථා තිබියදීත් අදාළ බදු සංශෝදන කිරීමට නිරන්තරයෙන් අසමත් වීම.

ප්‍රතිශතයක් ලෙස දුම්වැටි මිලෙහි හෝ බද්දෙහි සිදුවන ඉහළ යාමට සාපේක්ෂව, දුම්වැටි පරිභෝජනයේ සිදුවන පහළ යාම, සැළකිය යුතු ලෙස පහත අගයක් ගන්නා

**රූප සටහන 1: මිලෙහි අන්තර්ගත බද්ද (2004-වර්තමානය)**




මූලාශ්‍රය: ශ්‍රී ලංකා ගැසට් නිවේදන (විවිධ වසර); දුම්වැටිවල වෙළඳපල මිල (2004-2018).

බවට පැහැදිලි සාක්ෂි සැමවිටම තිබී ඇත. 2016 බදු වැඩි කිරීමෙන් පසුව මෙය නැවත තහවුරු විය. මෙයින් අදහස් කරන්නේ මිල/ බදු වැඩි කිරීම සැමවිටම ඉහළ ආදායමක් ලබා දෙන බවයි.

2018 මැයි 23 වන දින ප්‍රකාශයට පත් කරන ලද "The hidden side of cigarette pricing" නම් VR විද්‍යුත මගින්, දුම්කොළ කර්මාන්තය මෙම සම්බන්ධතාවය මනාව තේරුම් ගෙන ඇති බවත්, එය ඔවුන් 2005 සිට රජය බදු වැඩි කරන වේගයට වඩා වැඩි වේගයකින් දුම්වැටියක බදු ගෙවූ පසු මිල වැඩි කර ඇති ආකාරයෙන් පෙන්නුම් කරන බවත් දක්වා ඇත. කර්මාන්තයේ ලාභයද ඒ අනුව ඉහළ යමින් තිබේ. කර්මාන්තය විසින්, මිල ඉහළ දැමීම ආදායම මත ඇති කරන ධනාත්මක බලපෑම නිවැරදිව ගණනය කර ඇති බව මෙයින් පෙනේ. ඒ කෙසේ වෙතත්, ආදායම් ඉලක්ක

සපුරා ගැනීම සඳහා රජය මහත් පරිශ්‍රමයක් දරන්නේ යැයි යන පදනම මත, පුද්ගල ආදායම මත බදු, වාණිජ ව්‍යාපාර මත බදු සහ අත්‍යවශ්‍ය භාණ්ඩ සඳහා සැලකිය යුතු බදු වැඩි කිරීම් හඳුන්වා දුන් නමුත් , පසුගිය මාස 20 තුළ මුදල් අමාත්‍යාංශය දුම්වැටි සඳහා වන බද්ද නොවෙනස්ව තබා ගැනීමට තීරණය කර තිබේ.

***

ඉහත කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මුදල් අමාත්‍යාංශයේ උපදෙස් හා ක්‍රියාමාර්ග මහජන සෞඛ්‍යය හෝ රාජ්‍ය ආදායම පිළබඳ ජාතික අවශ්‍යතාවන්ට අනුකූල නොවන බව පෙනේ. මෙම හැසිරීම් රටාව හේතුවෙන් පහත ප්‍රශ්නය අසන්නටම සිදු වේ: මුදල් අමාත්‍යාංශය විසින් ගනු ලබන තීරණ සහ නීතිදු කෙරෙහි මෙම ඇල්මැති පාර්ශවයන්ගේ බලපෑම කෙබඳුද? මහජන යහපත වෙනුවෙන් එම පාර්ශවයන්ගෙන් සිදුවන බලපෑම අඩු කරන්නේ කෙසේද?

## නෛයාකාරයක හෙළිදරවු කිරීම් හරහා දුම්කොළ ප්‍රතිපත්තියට ඇති බලපෑමට එරෙහිව කටයුතු කිරීම

ශ්‍රී ලංකාවේ දුම්කොළ ප්‍රතිපත්තියට ඇඟිලි ගැසීමට එරෙහිව කටයුතු කිරීම, එෆ්.සී.ටී.සී 5.3 වගන්තිය අනුගමනය කිරීමෙන් හා එය ක්‍රියාත්මක කිරීම පිළිබඳ අදාළ ලෝක සෞඛ්‍ය සංවිධානයේ මාර්ගෝපදේශ අනුගමනය කිරීමෙන් ආරම්භ කළ හැකිය. මෙම මාර්ගෝපදේශ පහත දැක්වෙන පරිදි ආකාර තුනක හෙළිදරවු කිරීම් ලෙස සැකෙවින් පැහැදිලි කළ හැක,

**1. කර්මාන්තයේ ක්‍රියාකාරීන් හෙළිදරව් කිරීම:** දුම්කොළ කර්මාන්තයේ නියැලෙන්නන් හෝ එහි වර්ධනය වෙනුවෙන් කටයුතු කරන ඇල්මැති පාර්ශව, ලියාපදිංචි වීමේ ක්‍රියාවලියක් තුළින් තමාම පිළිබඳව හෙළිදරව් කළ යුතුය (මෙම පියවර ලෝක සෞඛ්‍ය සංවිධානයේ එෆ්.සී.ටී.සී. (FCTC) මාර්ගෝපදේශ වල 2 වන මූලධර්මයෙන් උපුටා ගන්නා ලද්දකි.)

**2. සන්නිවේදනය පිළිබඳ අනාවරණය කිරීම:** දුම්කොළ කර්මාන්තයේ නියැලෙන්නන් සහ ප්‍රතිපත්ති සම්පාදකයින් අතර ඇතිවන සියලුම සන්නිවේදන පටිගත කර අනාවරණය කළ යුතුය. (මෙම පියවර ලෝක සෞඛ්‍ය සංවිධානයේ එෆ්.සී.ටී. සී. (FCTC) මාර්ගෝපදේශ වල 3 වන මූලධර්මයෙන් උපුටා ගන්නා ලද්දකි.)

**3. අභිලාෂ අතර ගැටුම් පිළිබඳ අනාවරණය කිරීම:** දුම්කොළ කර්මාන්තය විසින් ප්‍රතිපත්ති සම්පාදකයින්, දේශපාලන පක්ෂ, මාධ්‍යවේදීන් සහ මාධ්‍ය ආයතනවලට (හෝ තවදුරටත් කර්මාන්තයේ වර්ධනය සඳහා කටයුතු කරන අයට) සපයනු ලබන සේවාවන් සහ අරමුදල් ඇතුළුව ඕනෑම ආකාරයක දිරිගැන්වීමක් හෝ ප්‍රතිලාභයක්, එම හුවමාරුවට සම්බන්ධ සියලු පාර්ශවයන් විසින් හෙළි කළ යුතුය. (මෙම පියවර ලෝක සෞඛ්‍ය සංවිධානයේ එෆ්.සී.ටී.සී. (FCTC) මාර්ගෝපදේශ වල 2 වන මූලධර්මයෙන් උපුටා ගන්නා ලද්දකි.)

මෙම පියවර තුනෙන් පමණක් දුම්කොළ ප්‍රතිපත්තිය මත කර්මාන්තය ඇති කරන බලපෑම පිළිබඳ ගැටළුව සම්පූර්ණයෙන් විසඳා ගත නොහැකි වුවද, බලපෑම් සිදුවීමට ඉඩ සලසන අනාවරණය නොකළ සම්බන්ධතා මෙමගින් හෙළි කරනු ඇත. එවැනි සම්බන්ධතා හඳුනාගත් පසු, සන්නිවේදනය සීමා කිරීම සහ ප්‍රතිපත්ති සම්පාදකයින් සහ දුම්කොළ කර්මාන්තය අතර ඇති වන අභිලාෂ පිළිබඳ ගැටුම් වැළැක්වීම සඳහා FCTC විසින් නිර්දේශ කරනු ලබන වඩාත් දැඩි පියවර ගත හැකිය. මේ අනුව, හෙළිදරව් කිරීමේ අවශ්‍යතා සකස් කර ප්‍රකාශයට පත් කිරීම, දුම්කොළ ප්‍රතිපත්තියට ඇල්මැති පාර්ශවයන්ගෙන් ඇති බලපෑම අවම කිරීමේ දිගු ඉදිරි ගමනකට තබන ඵලදායී මුල් පියවරක් විය හැක.

Copyright © 2018 Verité Research Pvt Ltd. All Rights Reserved.